# ධම්මපදය

## චිත්ත වර්ගය (01-02 ගාථා)

**1. ගාථාව**

**ඵන්දනං චපලං චිත්තං - දූරක්ඛං දුන්නිවාරයං,**
**උජුං කරෝති මේධාවී - උසුකාරෝ ’ව තේජනං.**

**පදගතාර්ථය**

**ඵන්දනං** - සැලෙන්නා වූ, **චපලං** - ස්ථිර නො වූ, **දූරක්ඛං** - දුක සේ රැකිය යුතු වූ, **දුන්නිවාරයං** - දුසිරිත් නො වැළකිය හැකි වූ, **චිත්තං** - සිත, **මේධාවී** - නුවණැත්තේ, **උජුං කරෝති** - ඍජු කෙරෙයි (කුමක් මෙන් ද යත්), **උසුකාරෝ ’ව** - වඩු තෙමේ, **තේජනං** - හී දණ්ඩක් (ඇද මැඩ ඍජු කරන්නාක් මෙනි.)

**භාවාර්ථය**

නුවණැත්තේ නිතර සැලෙන්නා වූ චපල වූ රැකිය නො හැකි, වැලකිය නො හැකි සිත, හී වඩුවා හී දණ්ඩක් ඇද හරින්නාක් මෙන් ඍජු කෙරෙයි.

**2. ගාථාව**

**වාරිජෝ ’ව ථලේඛිත්තෝ - ඕකමෝකත උබ්භතෝ,**
**පරිඵන්දති’දං චිත්තං - මාරධෙය්‍යං පහාතවේ.**

**පදගතාර්ථය**

**ඕකමෝකත** - ජල සංඛ්‍යාත වාසස්ථානයෙන්, **උබ්භතෝ** - උඩට ගත්, **ථලේඛිත්තෝ** - ගොඩ දමන ලද්ද වූ, **වාරිජෝ ’ව** - මත්ස්‍යයෙකු මෙන්, **ඉදං චිත්තං** - මේ සිත (නොයෙක් අරමුණෙහි හැරීම් වශයෙන්) **පරිඵන්දති** - අතිශයින් සැලෙයි, **මාරධෙය්‍යං** - (එනිසා) ක්ලේශ වෘත්තය, **පහාතවේ** - පහකට යුතු යි.

**භාවාර්ථය**

දියෙන් ගොඩ දැමූ මත්ස්‍යයෙකු මෙන් කෙලෙස්වට නො හැර සිටියා වූ මේ සිත සැලෙයි. එහෙයින් කෙලෙස්වට දුරු කරන්නට ම සුදුසු ය.

**නිදන කථාව**

සම්මාසම්බුදුරජාණන් වහන්සේ එක් කලෙක වාලිකා (චාලිකා) නුවර අසල වාලිකා (චාලිකා) පව්වෙහි කරවන ලද මහා විහාරයෙහි වැඩ වාසය කරන සේක. එකල බුදුරජාණන් වහන්සේට උපස්ථාන කළෝ, මේඝිය ස්ථවිරයන් වහන්සේ ය. දිනක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ සිටි තෙරුන් වහන්සේ, මම පිඬු පිණිස ජන්තු ග්‍රාමයට යනු කැමැත්තෙමි. ඊට අවසරැ’යි කියා අවසර ඉල්ලා සිටියාහ. භාග්‍යවතුන් වහන්සේ මේඝිය තෙරුන් වහන්සේට ඒ පිණිස අවසර දුන්හ. ඉක්බිති එම තෙරුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පොරවා පාත්‍රසිවුරු ගෙන ජන්තු ග්‍රාමයට පිඩු පිණිස වැඩියහ. එහි පිඬු සිඟා පිණ්ඩපාතයෙන් හැරී අවුත් පස්වරුවෙහි කිමිකාලා ගං ඉවුරට වැඩියෝ ය. කෙණ්ඩා විඩාව දුරු කරන්නට එහි ඔබිනොබ හැසිරෙන්නෝ, සිත්කලු අඹ උයනක් දැක ‘මේ උයන සිත් කලු ය. ජනසමාජයෙන් ඈත් ව මහණදම් පුරන්නහුට ඉතා කදිම තැන ය. භාග්‍යවතුන් වහන්සේ මට අවසර දෙන සේක් නම්, මම මහණදම් පුරන්නට මෙහි එන්නෙමි’යි සිතා බුදුරජුන් වෙත ගොස් වැඳ “ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, අවසර, මම පෙරවරුයෙහි හැඳ පොරවා පාසිවුරු ගෙන ජන්තු ග්‍රාමයෙහි පිඩු සිඟා ගියෙමි. සිඟා අවසන් කොට විඩා සන්සිඳුවන්නට සිතා පස්වරුයෙහි කිමිකාලා ගං ඉවුරට ගියෙමි, එහි පිහිටි අඹ උයන නම් මහණදම් පුරන්නට ඉතා කදිම ය, සිත්කලු ය, භාග්‍යවතුන් වහන්සේ අනුදන්නා සේක් නම්, මම මහණදම් පුරන්නට එහි යම්’යි මට සිත් විය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ අනුදන්නා සේක් නම්, මම එහි යන්නෙමි”යි කියා දන්වා සිටියහ. එවිට බුදුරජාණන් වහන්සේ

බලා වදාරන සේක්, මේඝිය තෙරුන්ගේ නුවණ මුහුකුරා නො ගිය බව දැන ගමන වළක්වන්නට, "මේඝිය, ඔබ ගියහොත් මම තනි වෙමි, අනික් නමක් එනතුරු මදක් නවතින්නැ"යි වදාළ සේක. (මෙතෙම එහි ගොස් කටයුතු සිදු නො වූ කල්හි පෙරළා එන්නේ ය'යි දැන මොහුගේ සිතෙහි මොලොක් බව උපදවන්නට මෙසේ වදාළ සේක.) මේඝිය ස්ථවිරයන් වහන්සේ දෙවනුව ද "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඉදිරියට කළ යුතු කිසිවක්, භාග්‍යවතුන් වහන්සේට නැත. වැඩූ මග නැවත වැඩීමක් ද නැත. ප්‍රහීණ කළ කෙලෙසුන් නැවත ප්‍රහාණයකුත් නැත. ස්වාමීනී මට එසේ නො වේ. ඉදිරියට කළ යුතු වැඩ ඇත්තේ ය. මා ආර්යමාර්ගය අවබෝධ නො කළ බැවින් ආර්යමාර්ගයාගේ වැඩීම කැමති විය යුතු ය. එහෙයින්, භාග්‍යවතුන් වහන්සේ අවසර දෙන සේක් නම් මම මහණදම් පුරන්නට ඒ අඹ උයනට යන්නෙමි"යි කී ය. බුදුරජාණන් වහන්සේ දෙවනු ව ද පෙර සේ ම මේඝිය තෙරුන්ට වදාළ සේක. මේඝිය තෙරණුවෝ තෙවන වරටත් පළමු ලෙසින් කරුණු කියා යන්නට අවසර ඉල්ලූහ. බුදුරජාණන් වහන්සේ ඒ තෙවන වර "මේඝිය, මහණදම් පුරමි'යි කියන්නහුට අපි අන් කුමක් කියමු ද? ඔබ ම එයට කල් දත යුතු ය"යි වදාළ විට හුනස්නෙන් නැගිට පා වැඳ පැදකුණු කොට අඹ උයනට ගොස් එහි එක්තරා ගසක් මුලෙක දිවා විහරණය පිණිස වැඩහුන්හ. මේඝිය තෙරුන් දිවා විහරණයට හුන් තැන වනාහි තමන් පිළිවෙළින් ජාති පන්සියයක් ම රජ ව ඉපිද නන් වැදෑරුම් නළඟනන් පිරිවරා හුන් තැන ම විය. එහෙයින් එතැන හුන් තෙරුන් වහන්සේට මහණදම් අතුරුදහන් ව ගියා සේ ද, රජ වෙස් ගෙන නළඟනන් පිරිවරා සේසත යට මාහැඟි රජ අසුනේ ඉන්නා සේ ද වැටහුණි. එකෙණෙහි ඔහු සිත කාමවිතර්කයන් උපන. තෙරුන් වහන්සේ, බඩු සහිත ව අල්ලාගත් සොරුන් දෙදෙනෙකුන් තමන් ඉදිරියට පමුණුවා සිටියවුන් සේ දුටහ.

එකෙනෙහි ඔවුන් අතුරෙන් එකෙකුට වදය නියම කිරීම් වශයෙන් ව්‍යාපාද විතර්කය ද අනෙකෙකුට සිර දඬුවම් නියම කිරීම් වශයෙන් විහිංසා විතර්කය ද උපන. එකල මේඝිය ස්ථවිරයන් වහන්සේව වැල් ගොඩකින් වෙළුණු ගසක් මෙන් ද මී මැස්සන් විසින් වට කර ගත් මී කඩන්නෙකු සේ ද අකුසල විතර්කයන් විසින් වට කර ගන්නා ලදී. 'මම ගිහිගෙයින් නික්ම මේ සසුනෙහි පැවිදි වූයේ ශ්‍රද්ධාවෙන් ම ය. එසේ වුවත් ලාමක අකුසල විතර්කයෝ මා වට කර ගත්හ. දැන් මෙහි මහණදම් කරන්නට නො හැකි ය. දූරදර්ශී වූ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් ම මෙය දැන වදාරා මාගේ ගමන වැළකූ සේක. එහෙයින් භාග්‍යවතුන් වහන්සේට මෙය දැන්විය යුතු ය'යි හුන් තැනින් නැගිට ගොස් බුදුරජාණන් වහන්සේ වෙත එළඹ "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මා අඹ උයනෙහි දිවා විහරණය පිණිස හුන් සැටියේ ම ලාමක අකුසල විතර්කයෝ මා වට කර ගත්හ. එවිට 'මා පැවිදි වූයේ ශ්‍රද්ධාවෙන් ම ය. එහෙත් ලාමක අකුසල විතර්කයෝ මා වට කර ගත්හ'යි මට සිත් වියැ"යි දන්වා සිටියහ.

ඉක්බිති බුදුරජාණන් වහන්සේ තමන් වෙත පැමිණි මේඝිය තෙරුන් අමතා, "මේඝිය ඔබ විසින් කරන ලද්ද ඉතා බැරෑරුම් ය. එය සුළු නො වේ. බලගතු ය. මේඝිය, ටිකක් නවතින්නැ'යි කියද්දීත් මා තනි කොට හැරදමා ඔබ ගියෙහි ය. එසේ ගිය මහණ සිතට යටත් වීම යුතු නැත. සිත ඉතා සැහැල්ලු ය. එය තම වසඟයට ගත යුතු ය"යි දක්වන්නට මේ ධර්ම දේශනාව වදාළ සේක.

දේශනා අවසානයේ මේඝිය ස්ථවිරයන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටි සේක. අන් බොහෝ දෙනා ද සෝවාන් ඵලාදිය ලැබුවෝ වූහ.

සාධු ! සාධු !! සාධු !!!

__සම්පාදක:__ පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ ප්‍රධාන අනුශාසක අතිගරු පූජනීය මීතලාවේ විනීත ස්වාමීන් වහන්සේ

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
(බක් 2550)

__පිටු සැකසීම:__ පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත තරුණ උපාසක මහතා.

__ධර්මදානය:__ පින්වත් දයාසීලී උපාසිකා මාතාව විසින් හා උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් තමන්ට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්ම දේශනා ඇතුළු පටිගත කරන ලද ධර්ම දේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**